# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2183/21 - 2020 ජූලි මස 07 වැනි අඟහරුවාදා - 2020.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

**ජනාධිපති විධානය**

1. පුරාවිද්‍යා චක්‍රවර්තී පූජ්‍ය එල්ලාවල මේධානන්ද නායක ස්වාමීන් වහන්සේ
2. උතුර සහ නැගෙනහිර දෙපළාතේ සහ තමන්කඩුව දිශාවේ ප්‍රධාන සංඝනායක
   අරිසිමලේ ආරණ්‍ය සේනාසනාධිපති පූජ්‍ය පනාමුරේ තිලකවංශ නායක ස්වාමීන් වහන්සේ
3. මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමා
   ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
4. ආචාර්ය සෙනරත් බණ්ඩාර දිසානායක මැතිතුමා
   පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්
5. චන්ද්‍රා හේරත් මැතිතුමිය
   ඉඩම් කොමසාරිස් ජනරාල්
6. ඒ.එල්.එස්.සී. පෙරේරා මැතිතුමිය
   මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව
7. මහාචාර්ය රාජ් කුමාර් සෝමදේව මැතිතුමා
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කැළණිය විශ්වවිද්‍යාලය
8. මහාචාර්ය කපිල ගුණවර්ධන මැතිතුමා
   පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෛද්‍ය පීඨය
9. දේශබන්දු තෙන්නකෝන් මැතිතුමා
   ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, බස්නාහිර පළාත
10. එච්.ඊ .එම්.ඩබ්ලිව්.ජී. දිසානායක මැතිතුමා
    පළාත් ඉඩම් කොමසාරිස්, නැගෙනහිර පළාත
11. දිලිත් ජයවීර මැතිතුමා
    සභාපති, දෙරණ මාධ්‍ය ජාලය

වෙත,

1A - G 032269 — 32 (2020/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුභාශිංසන පූර්වකව!

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, 2020.06.01 වැනි දින දරන ජනාධිපති විධානය මගින් පිහිටුවන ලද නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් ඔබතුමන්ලා පත් කරනු ලැබ ඇති හෙයින් ද,

එම කාර්ය සාධක බලකායේ විෂයය නිර්ණය සහ රාජකාරී අදළත්වය පිළිබඳව සැලකීමේ දී උක්ත සාමාජිකයින්ට අමතරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජනයක අවශ්‍යතාවය හඳුනාගෙන ඇති බැවින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, රියර් අද්මිරාල් ආනන්ද පීරිස් මැතිතුමා, එතුමාගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පූර්වෝක්ත ජනාධිපති විධානය ප්‍රකාරව පිහිටුවනු ලැබූ නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන කාර්ය සාධක බලකායේ සාමාජිකයෙක් ලෙස මෙයින් පත් කරමි.

වර්ෂ දෙදහස් විස්සක් වූ ජුනි මස 30 වැනි දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී.බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.